Lanka Salt Ltd.
ISO 9001, 22000 Certified Company
Committed to the freedom from brain damage with iodized salt

# ලංකා සෝල්ට් ලිමිටඩ්

SLS ප්‍රමිති සහතිකය සහ ISO 9001;ISO 22000 ජාත්‍යන්තර තත්ත්ව සහතික වලින් පිදුම් ලද ලංකාවේ ප්‍රධානතම ලුණු නිෂ්පාදකයා වන ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය පහත සඳහන් පුරප්පාඩු තනතුර සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසු අයදුම්කරුවන් හට පිළිගත් ආයතනයක / සංවිධානවල අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව පළපුරුද්ද තිබිය යුතු අතර, ඔහු /ඇය ක්‍රියාකාරී හා කාර්යශූර හා බුද්ධිමත් අයෙකු විය යුතුය.

**පත්වීමේ ස්වභාවය :**

සේවක සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට සහ සේවක අර්ථසාධක අරමුදලට හිමිකම සහිත ස්ථිර පත්වීමක් වන අතර, වසරක පරිවාස කාලයකට යටත්වේ. ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ ස්ථිර පදනම මත බඳවාගන්නා අයට හිමි වරප්‍රසාද සියල්ල මෙම තනතුරට හිමි වේ.

**වෙනත් :**

**සෑම ඉල්ලුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක ස්වභාවයකින් යුක්ත විය යුතුය.
- ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය යටතේ පවත්වාගෙන යන මහලේවාය, බූන්දල ලේවාය හා පලටුපාන ලේවාය යන ඕනෑම ස්ථානයක අවශ්‍යතාවය අනුව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**වයස් සීමාව:**

- වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග අයදුම්පත් සහ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් 2025 මැයි මස 16 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට යොමු කරන්න. අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කරන්න.
- මෙම තනතුර පිරවීමේ බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතුවේ.

## කළමනාකරු - රසායනඥ තත්ත්ව පාලන MM 1-1 (තනතුරු 01)

**පහත සඳහන් රාජකාරී ප්‍රධාන ක්ෂේත්‍ර ඉටු කිරීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන කළමනාකරුට සහාය වීම.**

**ප්‍රධාන රාජකාරී ක්ෂේත්‍ර:**

1. රසායනාගාරය නඩත්තු කිරීම හා ලුණු නිෂ්පාදන සහ ලුණු ජලය පරීක්ෂා කිරීම සිදු කිරීම.
2. රසායනාගාරය පවත්වාගෙන යාම සහ ලබා දී ඇති ප්‍රමිතියට අනුව ලුණු නිෂ්පාදනය සහ ලුණු ජලය පරීක්ෂා කිරීම.
3. සියලුම ලුණු දැමීම් ලුණු නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ගුණාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යන බවට සහතික වීම.
4. දෙපාර්තමේන්තුවට නායකත්වය සැපයීම.
5. නිත්‍ය සාම්පල පරීක්ෂා කර අවශ්‍ය තත්ත්ව ප්‍රමිතීන් සහතික කිරීම.
6. කර්මාන්තශාලා සමග සමීපව වැඩ කිරීම සහ එක් එක් ලුණු ලේවාය නිෂ්පාදන ක්‍රියාවලිය නියමිත ප්‍රමිතියට පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීම.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්:-**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව, විද්‍යාවේදී භෞතික විද්‍යාව, රසායනාගාර තාක්ෂණ විද්‍යාව පිළිබඳ උපාධිය හෝ සමාන අංශයකින් ලබාගත් උපාධියක් සමග, උපාධිය ලබාගැනීමෙන් පසු ලුණු හෝ ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ රජයේ, රාජ්‍ය සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) ක පශ්චාත් සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

2. ලංකා ලුණු සමාගමේ JM 1 - 1 කනිෂ්ඨ විධායක කාණ්ඩයේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) ක සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය** : MM 1-1 රු . 53,175- 10X1,375+15X1,910= 96,325/=

**මූලික වැටුප් පියවර** : රු.53,175/=

**අමතර දීමනා** : (ජීවනාංක දීමනාව -17,800 +පැමිණීමේ දිරි දීමනා මාසික පැමිණීමේ දින ගණන් අනුව - 2,000 + මාසික දිරි දීමනා - 5,000 + විශේෂ දීමනා 5,000)

## කනිෂ්ඨ විධායක සහකාර යාන්ත්‍රික ඉංජිනේරු / විදුලි JM 1-1(තනතුරු 05)

**ප්‍රධාන රාජකාරී ක්ෂේත්‍ර:**

**ලංකා ලුණු සමාගමේ නිෂ්පාදන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා සහකාර සාමාන්‍යාධිකාරී සහ නිෂ්පාදන හා ඉංජිනේරුගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ අවශ්‍ය සිවිල්, යාන්ත්‍රික,තාක්ෂණික, කාර්මික සහ විදුලි අංශ වල යන්ත්‍ර සූත්‍ර උපකරණ පද්ධති නඩත්තු කිරීම, පවත්වා ගෙන යාම සහ අවශ්‍ය අලුත්වැඩියා කිරීම හා ක්ෂණික බිඳ වැටීම් වලට පිළියම් යොදා නිෂ්පාදනයට බාධාවක් නොවන අයුරින් කටයුතු කිරීම සහ සහාය කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීම, ඔවුන්ට මඟ පෙන්වීම සහ වෘත්තීය දියුණුවට අදාළ කටයුතු කිරීම.**

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්:-**

1. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ උපාධිය ලබා තිබීම.
2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.
4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පහ (05) මට්ටමට නොඅඩු මට්මටක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. කළමනාකරණ සහකාර තාක්ෂණ (MA2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** : රු.42,600-10X755+18X1,135 = රු.70,580.00

**මූලික වැටුප් පියවර** : රු42,600.00

**අමතර දීමනා** : (ජීවනාංක දීමනාව -17,800 +පැමිණීමේ දිරි දීමනා මාසික පැමිණීමේ දින ගණන් අනුව - 2,000 + මාසික දිරි දීමනා - 5,000 + විශේෂ දීමනා 5,000)


**සභාපති,**

**ලංකාසෝල්ට් ලිමිටඩ්,**

**මහලේවාය, හම්බන්තොට.**

**දුරකථනය: 047-2037300**